බැංකු නියාමන චක්‍රලේඛ - 02/2025

මගේ අංකය - DCDSP/02/18/බැ.නි.
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
පෙට්ටිගලවත්ත - ගාල්ල.

2025.07. 07

දකුණු පළාතේ විවිධ සේවා සමුපකාර සමිති ඇතුළු මූල්‍ය කටයුතුවල නිරත වන සමුපකාර සමිති/ සංගම්වල ගරු සභාපතිවරුන් වෙත,

**සමුපකාර ග්‍රාමීය බැංකු සහ මූල්‍ය සේවා සමුපකාර සමිති/ සංගම්වල තැන්පත් පොළී අනුපාතික තීරණය කිරීම.**

## 1. හැඳින්වීම

සමුපකාර ග්‍රාමීය බැංකු සහ මූල්‍ය සේවා සමුපකාර සමිති/ සංගම් විසින් ඇතැම් අවස්ථාවලදී තැන්පත් සඳහා ගෙවනු ලබන පොලී අනුපාතිකයන් තරඟකාරී ලෙස ඉහළ දැමීම නිසා එම සමිති/ සංගම්වල මූල්‍ය තත්ත්වයට අහිතකර බලපෑම් සිදු වී ඇති බව නිරීක්ෂණය වේ. මේ වන විට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ද තැන්පත් පොලී අනුපාතික සීමා කිරීමේ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කර ඇති බැවින් සමුපකාර ග්‍රාමීය බැංකු සහ මූල්‍ය සේවා සමුපකාර සමිති/ සංගම් සම්බන්ධයෙන්ද තැන්පත් පොලී අනුපාතිකයන් යාවත්කාලීන කිරීම සුදුසු බව නිරීක්ෂණය වේ.

## 2. තැන්පත් පොලී අනුපාතික තීරණය කිරීම.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කාලීනව නිකුත් කරනු ලබන එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය (Overnight Policy Rate) පදනම් කර ගනිමින් සමුපකාර ග්‍රාමීය බැංකු හා මූල්‍ය සේවා සමුපකාර සමිති/ සංගම් විසින් ස්ථාවර තැන්පත් ඇතුළු සියලුම තැන්පත් සඳහා වන පොලී අනුපාතිකයන් තීරණය කිරීම පහත සඳහන් නිර්ණායකයන් අදාල කර ගනිමින් සිදු කළ යුතුය.

2.1 වසරක (මාස දොළහක) කල්පිරෙන කාලයක් සහිත ස්ථාවර තැන්පත් සඳහා පොලී අනුපාතිකය තීරණය කිරීමේදී, පොලී අනුපාතිකය තීරණය කරනු ලබන දිනට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තීරණය කර ඇති එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයට (Overnight Policy Rate) උපරිම වශයෙන් ඒකක 0.75 ක් දක්වා එකතු කර පොලී අනුපාතිකය තීරණය කළ හැකිය.

2.2 කල් පිරීමේ කාලය වසරකට (මාස දොළහකට) අඩු අනෙකුත් ස්ථාවර තැන්පත් සඳහා පොලී අනුපාතික තීරණය කිරීමේදී, එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයට (Overnight Policy Rate) ඒකක 0.75 ක් සමානුපාතිකව එකතු කල යුතුය. වසරකින් කල් පිරෙන ස්ථාවර තැන්පතු සඳහා වන පොලී අනුපාතිකයට සාපේක්ෂව පොලී අනුපාත තීරණය කල යුතු අතර එය එක්දින පොලී ප්‍රතිශතය නොඉක්මවිය යුතුය.

2.3 තවද වසරකට (මාස දොළහකට) වැඩි සහ වසර පහක් (මාස හැටක්) දක්වා කාලයකදී කල් පිරෙන කාලයන් සහිත ස්ථාවර තැන්පත් සඳහා පොලී අනුපාතික තීරණය කිරීමේදී, පොලී අනුපාතික තීරණය කරනු ලබන දිනට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තීරණය කර ඇති එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයට (Overnight Policy Rate) උපරිම වශයෙන් ඒකක 4.25 ක් කාලයට සමානුපාතිකව එකතු කර පොලී අනුපාතික තීරණය කළ හැකිය.

2.4 කාලීන සහ ඉතුරුම් තැන්පත් සඳහා පොලී අනුපාතික තීරණය කිරීමේදී, එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයට (Overnight Policy Rate) අවම ඒකක 4 ක් හෝ ඊට අඩුවෙන් පොලී අනුපාතික නියම කළ යුතුය. එහෙත් කොන්දේසි සහිතව ක්‍රියාත්මක වන තැන්පත් වර්ග සඳහා (අනිවාර්ය තැන්පත්, සුරැකුම් තැන්පත් ..... ) පොලී අනුපාත සීමා කිරීමක් සිදු නොකරන අතර මෙම පොලී අනුපාතයන්ට සමගාමීව තාර්කික පොලී අනුපාතයන් තීරණය කල යුතුය.

2.5 මාසිකව ස්ථාවර තැන්පත් පොලිය ලබා ගන්නේ නම්, ස්ථාවර තැන්පත් සඳහා හිමි පොලී අනුපාතිකයෙන් 0.25% ක පොලී ප්‍රතිශතයක් අඩු කළ යුතුය.

2.6 මූල්‍ය වෙළඳපල හැසිරීම අනුව තැන්පත් පොලී අනුපාත සම්බන්ධයෙන් තීරණ ගැනීමේදී මෙම චක්‍රලේඛයේ නියාමනයන්ට අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය (Overnight Policy Rate) පිළිබඳ යාවත්කාලීන තොරතුරු අදාල කර ගත යුතු අතර ශ්‍රී ලංකා මහ බැංකුවේ නිල වෙබ් අඩවිය (www.cbsl.gov.lk) වෙත පිවිසීමෙන් එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය (Overnight Policy Rate) පිළිබඳ යාවත්කාලීන තොරතුරු ලබා ගත හැකිය. එම තොරතුරු මත ඔබ සමුපකාර සමිතියේ/ සංගමයේ වත්කම් සහ වගකීම් කළමනාකරණ කමිටුව (Asset and Liability Management Committee - ALCO) විසින් පොලී අනුපාතික තීරණය කළ යුතුය. එකී තීරණ සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ක්‍රියාත්මක කල යුතුය.

2.7 ඔබේ පහසුව සඳහා 2025.07.01 දිනට වූ මහ බැංකු එක්දින පොලී අනුපාත අනුව මෙම චක්‍රලේඛයට අදාලව සකස් කල තැන්පත් පොලී අනුපාත සීමා වගු අංක 01 හි දක්වා ඇත.

මෙම් චක්‍රලේඛයේ විධිවිධාන 2025.07.01 දින සිට දකුණු පළාතේ සියළුම සමුපකාර සමිති විසින් ක්‍රියාත්මක කල යුතු බව අවධාරණය කරමි. මීට පෙර සමුපකාර ග්‍රාමීය බැංකු සහ මූල්‍ය සේවා සමුපකාර සමිති/ සංගම්වල තැන්පත් පොලී අනුපාතික තීරණය කිරීම සම්බන්ධයෙන් නිකුත් කරන ලද චක්‍රලේඛ සහ නියාමන උපදෙස් පත්‍රිකාවල සඳහන් තැන්පත් පොලී අනුපාත සීමාවන් මින් අවලංගු කරමි.

සී. වික්‍රමසිංහ
සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් (වැ.බ.)
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
දකුණු පළාත

සී. වික්‍රමසිංහ,
සමුපකාර සංවර්ධන කොමසාරිස් /රෙජිස්ට්‍රාර් (වැ.බ.),
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
දකුණු පළාත.

පිටපත් -

01) සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (ගාල්ල,මාතර,හම්බන්තොට) - කා.දැ.ගැ.ස. සහ අ.ක.ස.

02) දකුණු පළාතේ විවිධ සේවා සමුපකාර සමිති ඇතුළු මූල්‍ය කටයුතුවල නිරත වන සමුපකාර සමිති ඇතුළු මූල්‍ය සේවා කටයුතුවල නිරතවන සමුපකාර සමිති භාර ප්‍රාදේශීය නිලධාරීන් - අදාල උපදෙස් ලබාදීමට සහ අධීක්ෂණය සඳහා.

වගු අංක 01

2025.07.01 දිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය (Overnight Policy Rate) 7.75 කි. ඒ අනුව මෙම අනුපාත සකසා ඇත.

| අනු අංකය | චක්‍රලේඛයේ වගන්තිය | තැන්පත් වර්ගය | දකුණු පළාතේ සමුපකාර සමිති සදහා වන උපරිම පොලී අනුපාතය | | සීමාන්තය කල හැකි උපරිම අනුපාතය | අවධානයට ගත යුතු කරුණු |
|---|---|---|---|---|---|---|
| | | | කල් පිරීමේදී තැන්පත්පොලිය ලබා ගන්නා තැන්පත් සදහා | මාසිකව තැන්පත් පොලිය ලබා ගන්නා තැන්පත් සදහා | | |
| 01 | 2.1 | ස්ථාවර තැන්පත් වසර 01 කල් පිරෙන | 8.50 | 8.25 | 1 | ශ්‍රී ලංකා මහ බැංකුවේ එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයට ඒකක 0.75 එකතු කිරීමෙන් ගණනය කල යුතුය. |
| 02 | 2.2 | වසර 01 ට අඩු | වසර 01 පොලී අනුපාතයට සාපේක්ෂව තීරණය කල යුතුය. | | | |
| 03 | 2.3 | කල් පිරෙන කාලය වසරකට වැඩි - අවු. 02 දක්වා | 9.00 | 8.75 | 0.5 | එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයට ඒකක 4.25 ක් කාලයට සමානුපාතිකව එකතු කිරීම තුලින් ගණනය කර ආසන්න පූර්ණ සංඛ්‍යාවට වටයා ඇත.<br>උදා - 7.75 + (4.25/60) x 24 (අවු. 2 කාලයකින් කල් පිරෙන) |
| | | කල් පිරෙන කාලය අවු. 02 – 03 දක්වා | 10.00 | 9.75 | 0.5 | |
| | | කල් පිරෙන කාලය අවු. 03 – 04 දක්වා | 11.00 | 10.75 | 0.5 | |
| | | කල් පිරෙන කාලය අවු. 04 – 05 දක්වා | 11.5 | 11.25 | 0.5 | |
| 04 | 2.4 | සාමාන්‍ය ඉතුරුම් තැන්පත් | 3.75 | | | කොන්දේසි මත පවත්වා ගෙන යන තැන්පතු මීට අදාල නොවන අතර ඒ සදහා මෙම ප්‍රතිශතයන් සාපේක්ෂව තීරණය කල හැකිය. |